# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1986 අංක 30 දරන
# අධ්‍යාපනික විද්‍යායතන පනත

---

[සහතිකය සටහන් කළේ 1986 සැප්තැම්බර් මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1986 සැප්තැම්බර් මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ ශත : 90 යි.          තැපැල් ගාස්තුව ශත : 75 යි.

# 1986 අංක 30 දරන අධ්‍යාපනික විද්‍යායතන පනත

[සහතිකය සටහන් කළේ 1986 සැප්තැම්බර් මස 23 වන දින.]

එල්. ඩී.—ඕ. 15/86

අධ්‍යාපනික විද්‍යායතන පිහිටුවීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1986 අංක 30 දරන අධ්‍යාපනික විද්‍යායතන පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දින යක එය ක්‍රියාත්මක විය යුතු ය.

*ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.*

**2.** (1) (මෙහි මින්මතු "අධ්‍යාපනික විද්‍යායතනය නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්—

*අධ්‍යාපනික විද්‍යායතනය නියමය.*

(අ) 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතනය පනත යටතේ ඉගැන්වීමේ සුදුසුකම් වශයෙන් පිළිගනු ලැබුවා වූ ද, ඒ නියමයෙහි සඳහන් වූ ද, ආයතනයේ උපාධි, ඩිප්ලෝමා සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය කිරීමට මගපාදන අධ්‍යයන පාඨමාලා පවත්වාගෙන යාමේ කාර්යය සඳහා (මෙහි මින්මතු "විද්‍යායතනය" යනු වෙන් සඳහන් කරනු ලබන) අධ්‍යාපනික විද්‍යායතන යක් පිහිටුවනු ලැබිය හැකි ය;

(ආ) ඒ විද්‍යායතනයට නමක් දිය හැකි ය; තව ද

(ඇ) ඒ විද්‍යායතනයේ මූලස්ථානය පිහිටා තිබිය යුතු ප්‍රදේශය හෝ භූමිභාගය නියම කළ හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් කවර හෝ අවස්ථාවක අධ්‍යාපනික විද්‍යායතන නියමය සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කළ හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ සෑම නියමයක් ම සහ (2) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ ඒ නියමයේ යම් සංශෝධනයක්, වෙනස් කිරීමක් හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එහි සඳහන් යම් දිනයක ක්‍රියාත්මක විය යුතු ය; තව ද ඉන්පසු හැකිතාක් ඉක්මණින් එය පාර්ලිමේන්තුව ඉදිරියේ සභාගත කළ යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ අධ්‍යාපනික විද්‍යායතන නියමයක් ක්‍රියාත්මක වූ විට, අධ්‍යාපනික විද්‍යායතන යක් ඒ නියමය මගින් එයට දෙන ලද නාමය යටතේ පිහිටුවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලැබූ සෑම විද්‍යා යතනයක් ම, ආයතනයට අනුබද්ධ විද්‍යායතනයක් වශයෙන් ලියා පදිංචි කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

8 ඒ 901719—7,400 (86/07)

අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලය.

3. මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලයක් විය යුතු අතර, එය, අමාත්‍යවරයාගේ විධානයට යටත් ව, විද්‍යායතනවල පාලන අධිකාරිය විය යුතු ය.

මණ්ඩලයේ සංයුතිය.

4. (1) මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) නිල බලයෙන් සාමාජිකයන් වන පහත සඳහන් තැනැත්තන්, එනම් :—

(i) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ii) මණ්ඩලයේ ප්‍රධාන කොමසාරිස්වරයා ; සහ

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ වෙනත් රජයේ නිලධරයන් සය දෙනෙක්.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වන ලේකම්වරයා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද, මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම, මිය යාම හෝ රජයේ නිලධරයකුව සිටීම අවසන් කිරීම හෝ නිසා කලින් ධුරය හිස් කළහොත් මිස, තමා ඒ ධුරයට පත් කරනු ලැබූ දිනයේ සිට අවුරුදු හතරක කාලයක් ධුරය දැරිය යුතු ය:

එසේ වුව ද, (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් හරි අඩක් සෑම දෙවන වර්ෂයේ දී ම විශ්‍රාම යා යුතු ය. එසේ විශ්‍රාම යාම සුරැකීමේ කාර්යය සඳහා, අමාත්‍යවරයා විසින් එසේ නිශ්චිතව සඳහන් කර ප්‍රථමයෙන් මණ්ඩලයට පත් කරන ලද සාමාජිකයන් තුන් දෙනකුගේ ධුර කාලය, මණ්ඩලයට පත්වීමේ දින සිට අවුරුදු දෙකක කාල සීමාවක් ඉකුත්වීමෙන් පසුව අවසන් විය යුතු ය.

(4) (අ) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද, මණ්ඩලයේ සාමාජිකයකු මිය යන හෝ රජයේ නිලධරයකුව සිටීම අවසන් කරන හෝ අවස්ථාවක, ඒ මිය ගිය හෝ රජයේ නිලධරයකුව සිටීම අවසන් කරන හෝ සාමාජිකයා වෙනුවට, සාමාජිකයකු වශයෙන් වෙනත් රජයේ නිලධරයකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(ආ) මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලැබූ, මණ්ඩලයේ යම් සාමාජිකයකු මිය යාම හෝ රජයේ නිලධරයකුව සිටීම අවසන් කිරීම හෝ නිසා කලින් ධුරය අත්හැරියහොත් මිස, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයකුට රෝගාතුරවීම හෝ වෙනත් අබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ නිසා, ස්වකීය ධුරයේ කාර්ය ඉටු

කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවෙන් වැඩ බැලීම සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් රජයේ නිලධරයකු පත් කරනු ලැබිය හැකි ය.

(6) මණ්ඩලයේ නිල බලයෙන් පත්වන සෑම සාමාජිකයකු ම, තමා මණ්ඩලයේ සාමාජිකයකු වූයේ යම් තනතුරක් ප්‍රකාර ද ඒ තනතුර දරන තාක් කල් ධුරය දැරිය යුතු ය.

5. 3 වන වගන්තියෙන් මණ්ඩලය වෙත පැවරුණු බලයේ ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත දැක්වෙන බලතල කෘත්‍ය හා කාර්ය මණ්ඩලය විසින්, ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය :— මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය.

(අ) විද්‍යායතන සඳහා කලින් කල සංවර්ධන සැලසුම් සම්පාදනය කිරීම සහ ඒ සැලසුම් අනුමතය සඳහා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම ;

(ආ) අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කරනු ලබන බවට විගබලා ගැනීම ;

(ඇ) එක් එක් විද්‍යායතනය සම්බන්ධයෙන් සැලසිය යුතු මූල්‍ය ප්‍රතිපාදන පිළිබඳව අමාත්‍යවරයාට කලින් කල උපදෙස් දීම ;

(ඈ) විද්‍යායතනවලට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන් වූ අවශ්‍යතා ආයතනයේ එකඟත්වය ඇතිව, රීති මගින් නියම කිරීම ;

(ඉ) එක් එක් විද්‍යායතනයට ඇතුළත් කර ගැනීම සඳහා ශිෂ්‍යයන් තෝරා ගැනීම ;

(ඊ) එක් එක් විද්‍යායතනයේ ශිෂ්‍යයන් සඳහා සැපයිය යුතු අධ්‍යයන පාඨමාලා සහ ප්‍රායෝගික පුහුණුව, ආයතනයේ එකඟත්වය ඇතිව නිශ්චය කිරීම ;

(උ) ආයතනයේ උපාධි, ඩිප්ලෝමා සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය කිරීමට කලින් ඒ උපාධි, ඩිප්ලෝමා සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය කිරීම හා සම්බන්ධව, විභාග සමත් විද්‍යායතනවල ශිෂ්‍යයන් විසින් සපුරාලිය යුතු අතිරේක කොන්දේසි, ආයතනයේ එකඟත්වය ඇතිව, නිශ්චය කිරීම ;

(ඌ) විද්‍යායතන පිහිටුවීමෙහි ලා සහාය වීම සහ පහසුකම් සැලසීම ;

(එ) විද්‍යායතනවල අරමුණුවලට සමාන අරමුණු ඇති ආයතන සමග ආචාර්යවරයන්, ශිෂ්‍යයන් හා ශාස්ත්‍රධරයන් හුවමාරු කර ගැනීම මගින් හෝ අන්‍යාකාරයෙන් සහයෝගය දැක්වීම හා එක්ව ක්‍රියා කිරීම ;

(ඒ) විද්‍යායතනවල අභ්‍යන්තර සංවිධානය නිශ්චය කිරීම ;

(ඔ) එක් එක් විද්‍යායතනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි ශාස්ත්‍රීය තනතුරු සහ වෙනත් තනතුරු ඇති කිරීම සම්බන්ධයෙන් උපදෙස් දීම ;

(ඕ) විද්‍යායතනවල පවත්වා ගෙන යා හැකි අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ආධාර ශිෂ්‍යත්ව හා පදක්කම් සහ වෙනත් ත්‍යාග ඇති කර ප්‍රදානය කිරීම ;

(ක) විද්‍යායතනවල ආචාර්ය මණ්ඩලයේ හා ශිෂ්‍යයන්ගේ වාසය, විනය හා ශුභ සිද්ධිය විධිමත් කිරීම ;

(ග) විනය කඩ කිරීම සම්බන්ධයෙන් යම් ශිෂ්‍යයන්, රීති ප්‍රකාර පහ කිරීම ;

(ච) විද්‍යායතනවල පාඨමාලා සහ වෙනත් සේවා සැලසීම සම්බන්ධයෙන්, ඒ සඳහා විධිවිධාන සලස්වන නියෝගවලට අනුකූලව ගාස්තු ඉල්ලා සිටීම හා භාර ගැනීම ;

(ජ) විද්‍යායතන සමීපයේ ඇති පාසැල්වල විෂයමාලා සාරවත් කිරීම, ඒ සම්බන්ධයෙන් වූ ඉගැන්වීමේ උපකරණ භාවිතය හා වෙනත් කර්තව්‍ය ප්‍රවර්ධනය කිරීම මගින් අධ්‍යාපනික ප්‍රමිති වැඩි දියුණු කිරීම ;

(ට) විද්‍යායතනවල කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම ; සහ

(ඩ) මණ්ඩලයේ මතය අනුව විද්‍යායතනවල අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහි ලා අවශ්‍ය හෝ හිතකර හෝ ආනුෂංගික වන වෙනත් සියලු ක්‍රියා හෝ දේ කිරීම.

මණ්ඩලයේ රැස්වීම.

6. (1) ලේකම්වරයා මණ්ඩලයේ සියලු රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. ලේකම්වරයා පැමිණ නොමැති විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින්, ඒ රැස්වීම්වල මූලාසනය දැරීම සඳහා තමන් අතුරින් සාමාජිකයකු තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(2) යම් රැස්වීමක් සඳහා වූ ගණපූරණය මණ්ඩලයේ සාමාජිකයන් පස් දෙනකුට නොඅඩු විය යුතු ය.

(3) මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කළ යුතු සියලු ප්‍රශ්න පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමතාවක දී, සභාපතිවරයාට හෝ මණ්ඩලයේ යම් රැස්වීමක මූලාසනය දරන වෙනත් යම් සාමාජිකයාට ස්වකීය ඡන්දයට අමතරව තීරක ඡන්දයක් ද තිබිය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් මණ්ඩලයේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු පිළිබඳව, එහි කාර්ය පටිපාටිය විධිමත් කර ගනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ ප්‍රධාන කොමසාරිස්වරයා.

7. (1) මෙහි මින් මතු " ප්‍රධාන කොමසාරිස්වරයා " යනුවෙන් සඳහන් කරනු ලබන මණ්ඩලයේ ප්‍රධාන කොමසාරිස්වරයකු පත් කරනු ලැබිය යුතු අතර, ඔහු, මණ්ඩලයේ ප්‍රධාන පරිපාලන නිලධරයා ද විද්‍යායතනවල අධිකාරිවරයා ද විය යුතු ය.

(2) මණ්ඩලයේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත් ව, විද්‍යායතනවල පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීම සහ මණ්ඩලයේ කාර්ය මණ්ඩලය පාලනය කිරීම ප්‍රධාන කොමසාරිස්වරයා වෙත පැවරෙන්නේ ය. මණ්ඩලයේ තීරණ ක්‍රියාවෙහි යෙදවීම සම්බන්ධයෙන් ද ඔහු වගකිව යුතු ය.

(3) මණ්ඩලය විසින් තමා වෙත පවරනු ලැබිය හැකි යම් බලතල, කාර්ය හා කර්තව්‍ය ප්‍රධාන කොමසාරිස්වරයා විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

රජය සතු වී ඇති ඇතැම් දේපළ ප්‍රධාන කොමසාරිස්වරයා විසින් පරිපාලනය කළ යුතු බව.

8. වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇත ද, 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත යටතේ රජය සතු වී ඇති හා යම් විද්‍යායතනයක කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන සියලු නිශ්චල දේපළ, ඒ පනතේ කාර්ය සඳහා පාවිච්චි කරනු ලැබූ ලෙස සහ එසේ පාවිච්චි කරනු ලබන ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ සියලු දේපළ රජය සඳහා හා වෙනුවෙන් ප්‍රධාන කොමසාරිස්වරයා විසින් කළමනාකරණය කිරීම හා පරිපාලනය කිරීම කළ යුතු ය.

විද්‍යායතනවල පීඨාධිපතිවරයෝ.

9. (1) 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කරන ලද අධ්‍යාපනික විද්‍යායතන නියමයක් මගින් පිහිටුවනු ලබන එක් එක් විද්‍යායතනය සඳහා පීඨාධිපතිවරයකු පත් කරනු ලැබිය යුතු ය.

(2) විද්‍යායතනයක පීඨාධිපතිවරයා, විද්‍යායතනයේ ප්‍රධාන අධ්‍යයන හා පරිපාලන නිලධරයා විය යුතු අතර, මණ්ඩලයේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව,—

(අ) තත් කාර්යය සඳහා නියම කරනු ලබන යම් රීතිවලට අනුකූලව විද්‍යායතනයට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම;

(ආ) ආයතනයේ එකඟත්වය ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් විශේෂිත අධ්‍යාපන විෂයයන්හි ලා උප දේශන හා පුහුණුව සැලසීම;

(ඇ) විද්‍යායතනයේ විනය පවත්වා ගෙන යාම;

(ඈ) විද්‍යායතනයට ඇතුළත් කර ගනු ලැබූ ශිෂ්‍යයන් සඳහා පහසුකම් සැලසීම;

(ඉ) විද්‍යායතනයේ ආචාර්ය මණ්ඩලයේ සහ ශිෂ්‍යයන්ගේ සදාචාරාත්මක, මානසික හා කායික ශුභසිද්ධිය ප්‍රවර්ධනය කිරීම; සහ

(ඊ) නියම කරනු ලැබිය හැකි වෙනත් යම් කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් ඔහු වගකිව යුතු ය.

මණ්ඩලයේ හා විද්‍යායතනවල කාර්ය මණ්ඩලය.

10. (1) ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා මණ්ඩලයට සහායවීම පිණිස අවශ්‍ය විය හැකි කාර්ය මණ්ඩලයක් පත් කරනු ලැබිය යුතු ය.

(2) ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා විද්‍යායතනයේ පීඨාධිපතිවරයාට සහාය වීම පිණිස අවශ්‍ය විය හැකි අධ්‍යයන හා අධ්‍යයන නොවන කාර්ය මණ්ඩලයක් එක් එක් විද්‍යායතනය සඳහා පත් කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ බලතල, ප්‍රධාන කොමසාරිස්වරයාට හෝ මණ්ඩලයේ යම් කමිටුවකට පැවරීම.

11. (1) මණ්ඩලය විසින්, ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය අතුරින් යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් මණ්ඩලයේ ප්‍රධාන කොමසාරිස්වරයාට හෝ මණ්ඩලයේ යම් කමිටුවකට හෝ පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් පවරනු ලැබූ ප්‍රධාන කොමසාරිස්වරයා විසින් හෝ යම් කමිටුවක් විසින්, මණ්ඩලයේ විධානයට හා පාලනයට යටත්ව, ඒ බලය, කාර්යය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

විද්‍යායතනවල අධ්‍යයන බලතල.

12. 2 (1) (අ) වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ සෑම විද්‍යායතනයක් විසින් ම පහත සඳහන් අධ්‍යයන බලතල, කර්තව්‍ය හා කාර්ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය :—

(අ) 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතනය පනත යටතේ ඉගැන්වීමේ සදුසුකම් වශයෙන් පිළිගෙන ඇති ආයතනයේ උපාධි, ඩිප්ලෝමා සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය කිරීම හා සම්බන්ධ අධ්‍යයන පාඨමාලා සහ පුහුණු වැඩ සටහන් සැලසීම ; සහ

(ආ) එවැනි උපාධි, ඩිප්ලෝමා සහ ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය කිරීම පිණිස ආයතනය විසින් නියම කර ඇති සුදුසුකම් ලබා ගෙන ඇති විද්‍යායතනයේ ශිෂ්‍යයන් නිසැකව දැන ගැනීමේ කාර්ය සඳහා ආයතනයේ එකඟත්වය ඇතිව හා ආයතනයේ අධීක්ෂණය යටතේ විභාග පැවැත්වීම.

ප්‍රධාන කොමසාරිස්වරයා රජය වෙනුවෙන් ගිවිසුම්වලට ඇතුළත් විය යුතු බව.

13. (1) යම් විද්‍යායතනයක කාර්යය සඳහා වූ යම් ගිවිසුමකට ප්‍රධාන කොමසාරිස්වරයා රජය වෙනුවෙන් ඇතුළත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය මගින් පවරනු ලැබූ යම් බලයක් ක්‍රියාත්මක කිරීමෙහි ලා, ප්‍රධාන කොමසාරිස්වරයා මණ්ඩලයේ විධානයට හා පාලනයට යටත් විය යුතු ය.

"අධ්‍යාපනික විද්‍යායතනය" යන වචන පාවිච්චි කිරීම පිළිබඳ සීමා කිරීම.

14. (1) මේ පනත ක්‍රියාත්මක වන දිනයෙහි හෝ ඉන් පසුව, මේ පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටවනු ලැබූ අධ්‍යාපන ආයතනයක් නොවන වෙනත් කිසිම අධ්‍යාපන ආයතනයක්, "අධ්‍යාපනික විද්‍යායතනය" යන වචන ඇතුළත් නමකින් හෝ නමක් යටතේ පිහිටුවීම හෝ පවත්වා ගෙන යාම නොකළ යුතු ය.

(2) යම් අධ්‍යාපන ආයතනයක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කිරීමක් සිදු වී ඇති අවස්ථාවක, ඒ ආයතනයේ පාලක බලමණ්ඩලය හෝ අයිතිකරු, වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, මේ

පනත ක්‍රියාත්මක වීමෙන් පසුව, එහි නාමය හෝ නාමයෙහි කොටසක් වශයෙන් "අධ්‍යාපනික විද්‍යායතනය" යන වචන පාවිච්චි කරනු ලැබූ දිනයට පසුව එළඹෙන එක් එක් දිනය සඳහා රුපියල් එක් දහසක දඩයකට ඒ පාලක බලමණ්ඩලය හෝ අයිතිකරු යටත් විය යුතු ය.

15. (1) මේ පනතෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ආණ්ඩුව විසින් පිහිටුවනු ලැබ පවත්වා ගෙන යනු ලැබූ සෑම අධ්‍යාපනික විද්‍යායතනයක් ම, ඒ දිනයේ සිට මාස දෙකක කාලයක් සඳහා පවත්වා ගෙන යනු ලැබිය යුතු ය. පවත්නා අධ්‍යාපනික විද්‍යායතන දිගටම පැවැත් විය යුතු බව.

(2) 2 වන වගන්තිය යටතේ කරන ලද නියමයකින් පිහිටුවනු ලැබූ අධ්‍යාපනික විද්‍යායතනයක් අනුප්‍රාප්ත වන්නේ (1) වන උපවගන්තියෙහි සඳහන් යම් විද්‍යායතනයක් සම්බන්ධයෙන් ද, ඒ විද්‍යායතනය ඒ සෑම නියමයක ම සඳහන් විය යුතු ය.

16. (1) පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් යම් කාරණයක් සඳහා සහ ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය :— නියෝග.

(අ) නියම කරනු ලැබිය යුතු යයි නියමිත හෝ නියෝග සෑදිය යුතු යයි නියම කරනු ලැබූ හෝ බලය පැවරී ඇති සියලු කාරණා ;

(ආ) විද්‍යායතනවල ආචාර්ය මණ්ඩලයේ සහ ශිෂ්‍යයන්ගේ සාමාන්‍ය සුභ සාධනය ; සහ

(ඇ) මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීම.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දිනයෙහි හෝ නියෝගයෙහි සඳහන් යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින්, අනුමතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතියේ දින සිට එහෙත් ඒ යටතේ කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරන ලදැයි සලකනු ලැබූ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"ආයතනය" යන්නෙන්, 1985 අංක 28 දරන පනතින් පිහිටුවනු ලැබූ ජාතික අධ්‍යාපන ආයතනය අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 යි. (විදේශීය) රු. 200 යි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.